## වාරිමාර්ග අමාත්‍යාංශය

# පුරප්පාඩු

# මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

## අරමුදල් ප්‍රභවය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යනු 2024 වන වසරේදී සම්පූර්ණ කිරීමට නියමිත ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් සහනදායී ණය පහසුකම් සහිතව වාරිමාර්ග අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන මහවැලි බහු කාර්ය සංවර්ධන වැඩසටහන හි මහා සැලැස්මෙහි (Master Plan) හි කොටසකි.

**අයදුම්පත් :**

යථා යෝග්‍ය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලබන අතර, අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත් සිය ජීවදත්ත තොරතුරු ප්‍රකාශ (CV) සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ද, අදාළ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත්ද සමග පහත ලිපිනයට 2021.12.01 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපැලෙන් එවිය යුතු වන අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. මෙයට අමතරව අයදුම්කරුවන් විසින් එම අයදුම්පතෙහි ඉදිරි පිටපතක් ලෙසින් ඊමේල් ලිපිනය : hr.mwsip@gmail.com ලිපිනයට පිටපත් කරමින් pdadbproject@gmail.com වෙත යොමු කළ යුතුය. **එම ඊමේල් ලිපිනයේ විෂය රේඛාවේ අයදුම්කරන තනතුර සටහන් කළ යුතුය.**

**වැඩසටහන් අධ්‍යක්ෂක,**
**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන,**
**අංක 493-1/1, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තු ගත කරනු ලබන අයදුම්කරුවන්, සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, කුසලතා පදනම මත සුදුස්සන් තෝරාගනු ලැබේ. එසේ හෙයින් **බඳවා ගැනීම් ක්‍රියාවලිය සඳහා බලපෑම් කිරීම හෝ නියෝජනයන් ඉදිරිපත් කිරීම, අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම කෙරෙහි බලපානු ලබනු ඇත.** මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතු වන අතර, සියලු අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලවල / සංස්ථාවල හෝ වෙනත් රජයේ ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතු වන අතර, එම ප්‍රධානීන් විසින් අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් පූර්ණකාලීනව දැනට දරන තනතුරින් මුදා හැරිය හැකිද යන වග සඳහන් කර එවිය යුතුය.

| තනතුර හා රැකියා පැතිකඩ | සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|
| **01. අධ්‍යක්ෂක (SIWRM) වැඩ සටහන් කළමනාකරණ ඒකකය (PMU) - කොළඹ - තනතුර 01 (PS - 2)**<br>**රැකියා පැතිකඩ**<br>ජල අංශ ප්‍රතිපත්ති, නීති රීති ව්‍යවස්ථා සහ ප්‍රධාන ජල අංශ ආයතනවල මිනුම් ප්‍රමිතිකරණය කිරීම, (Benchmarking) සඳහා නිර්දේශ කිරීම හා මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම මගින්, ජාතිකව ඒකාබද්ධ කළ ජල සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම, IWRM ආයතන ගත කිරීම වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම<br>දේශගුණ විපර්යාසවල බලපෑම් විශ්ලේෂණය කිරීම සහ එහි ජල කළමනාකරණය කෙරෙහි ඇති බලපැවැත්ම විමසා බැලීම, ජල ඉල්ලුම් හඳුනා ගැනීම, කළමනාකරණය සහ පරිසරය ඇතුළුව, ප්‍රධාන ජල පරිශීලකයන් හඳුනාගැනීම මගින් අඛණ්ඩ ජල සැපයුම් මූලාශ්‍ර සහිත බව තහවුරු කිරීම සඳහා පරිසරය හඳුනාගැනීම IWRM සඳහා ජල කළමනාකරණ මහලේකම් කාර්යාලය යාවත්කාලීන කිරීම හා නවීකරණය කිරීම සමග තීරණ ආධාරක ක්‍රම පද්ධතියක් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. | ✶ **පහත දැක්වෙන සුදුසුකම්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2019 වලට අනුකූල වනු ඇත.**<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තියවේදී සුදුසුකමක්<br>**සමග**<br>කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 15 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද හා ඉන් වසර 07 ක්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br>02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.<br>**හෝ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාන සුදුසුකමක්<br>**සහ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීයවේදී සුදුසුකමක්<br>**හෝ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 13 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද හා ඉන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br>03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාන සුදුසුකමක්<br>**සහ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්<br>**සහ**<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආයතනික / වරලත් සාමාජිකත්වයක් හෝ සමාන වෘත්තීයවේදී සුදුසුකමක්<br>**සමග**<br>කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 11 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද ඉන් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br>04. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 1 වන පන්තියේ නිලධාරියෙකුවීම හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක්<br>**සමග**<br>1 වන ශ්‍රේණියේ තනතුරක අඩුම තරමින් වසර 06 ක පළපුරුද්ද<br>✶ **වැටුප් තලය :** PS-2 - රු. 185,000.00 |
| **02. ගණකාධිකාරී (PS 04)**<br>**රැකියා විස්තරය :**<br>වැඩසටහනේ, මූල්‍ය හා ගිණුම්කරණ පද්ධති පිළියෙළ කිරීමට හා නඩත්තු කිරීමට මූල්‍ය කළමනාකරුට සහායවීම. සැලසුම්කරණය, අයවැය සකස් කිරීම, බැංකු ගිණුම් ආදිය ලෙජර් නඩත්තු කිරීම, ගෙවීම් සහ අභ්‍යන්තර පාලන කටයුතු මූල්‍ය වාර්තා පිළියෙල කිරීම, ප්‍රතිපූරණ ලිපිලේඛන සකස් කිරීම, ගබඩා කළමනාකරණ ක්‍රියා පටිපාටි, සත්‍යාපනය (verification) විගණන වාර්තා පිළියෙල කිරීම සහ වෙනත් මූල්‍ය කටයුතු වලට අදාළ පැවරුම් MWSIP හි කළමනාකාරිත්වයට අවශ්‍ය පරිදි සිදු කිරීම | 01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තියවේදී සුදුසුකමක්<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 09 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.<br>02. රජයේ දීප ව්‍යාප්ත සේවාවන්හි III/II පන්තියේ හෝ ඉහළ පන්තියක නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයට සමාන තත්ත්වයක්<br>**සමග**<br>III/II පන්තියේ තනතුරක අඩුම තරමින් වසර 09 ක පළපුරුද්ද.<br>✶ **වැටුප් තලය :** PS - 4 - රු 155,000.00 – රු. 170,000.00 |

✶ MSD චක්‍රලේඛ අංක 01/2019 පරිදි ඉහත වැටුප්වලට අමතරව ජීවන වියදම් දීමනාවද ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි**

01. අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.
02. සියලුම නිලධාරීන් අදාළ රජයේ ආයතන හා වෙනත් නියෝජිතායතන සමග සම්බන්ධව හා සම්බන්ධීකරණයෙන් යුක්තව සහයෝගයෙන් යුක්තව සිය රාජකාරී සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.
03. ශ්‍රී ලංකාවේ, විදේශ අරමුදල් ප්‍රතිපාදන ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.
04. ඉහත තනතුරු සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව, රජයේ නීති රීති, රෙගුලාසි හා හුරු පුරුදු බව සහ පරිගණක සාක්ෂරතාව, පූර්ව අවශ්‍යතාවයන් වනු ඇත.
05. සේවා / රැකියා කොන්ත්‍රාත්තු එක් වසරක කාල සීමාවකට හා වැඩසටහන්වල / ව්‍යාපෘතිවල අවශ්‍යතාවයන් හා කාර්ය සාධනයන් මත පදනම්ව වාර්ෂිකව නැවත අලුත් කරගත හැකි ඒවා වනු ඇත.
06. රජය අනුමත කර ඇති වැටුප් පරිමාණයන් හා දීමනාද සමග වැටුප් හා දීමනා කළමනාකරණ සේවා චක්‍රලේඛ (MSC) අංක 01/2019 සහ ඉන් පසු සංශෝධිත චක්‍රලේඛ පරිදි වනු ඇත. (http://www.treasury.gov.lk)

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**

Source: Dinamina (2021.11.19)